ධම්මං පිති සුඛං සේති - විප්පසන්නේන චේතසා
(දහම් රස බොන්නෝ සුවසේ නිදි වෙසෙත්තෝ)

# බෞද්ධ සංගමය


**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය**

අංක : 234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල
දුරකථන : 011 2864134 **ප්‍රධාන අනුශාසක :**
**බත්තරමුල්ල සිරි සුදස්සනාරාමාධිපති පූජනීය ආචාර්ය්‍ය මිරිස්සේ ධම්මික හිමි**

සදහම් පත්‍රිකා අංක 06

**බු.ව 2553 ඇසල පොහොය**


**උතුම් චතුරාර්‍ය්‍ය සත්‍ය අවබෝධ වීමට සදහම් පඩුරකි**



## සදහම් ගමනකට පවිටු ඇසුරින් මිදෙන්න.

නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

**"අසේවනාච බාලානං ඒතං මංගල මුත්තමං ති"**
**"දහමින් පිරිහුණු දුශ්ප්‍රාඥවත් අයගේ ආශ්‍රයක් නොමැතිවීම උතුම් දහම් මංගල්‍යයකි."**

ඔබට සැමට කරුණාවෙනි,

ඉහත සඳහන් කරනු ලැබුවේ ඛුද්දක නිකායේ අඩංගු මංගල සූත්‍රයෙහි පළමු මංගල කරුණයි. සරල දහමක් ලෙස මූලික අවසථාවෙහි හැඟුන ද නිවන් මඟ දක්වාම ගමන් කිරීමට අවශ්‍ය ප්‍රතිපදාවකි. මෙම උතුම් ශාසනයෙන් හරි අඩක්ම රඳා පවතින්නේ අඥාන අයගෙන් තොර කල්‍යාණ මිත්‍ර සේවනය නිසා නොවේදැයි අග්‍ර උපස්ථායක වූ ආනන්ද ස්වාමින් වහන්සේ විමසූ විට, බුදුරජාණන් වහන්සේගේ පිළිතුරු වූයේ මෙම උතුම් සසුනෙහි අඩක් නොව මුළු සසුනම පවත්නේ කල්‍යාණ මිත්‍ර අශ්‍රය නිසා බවය. ඔබ ඔබටම කළණ මිතුරෙක් වන්න. ඔබ ඔබටම විපත්ගෙන දෙන දුශ් ප්‍රාඥයෙක් නොවීම යහපති. ඔබගේ පරිසරයද කල්‍යාණ මිත්‍රතාවය මතම පවත්වා ගැනීමට උත්සාහ ගැනිම යහපති.

භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද මංගල සූත්‍රයෙහි සඳහන් උතුම් මංගල කරුණු තිස් අටෙන් පළමු කරුණ වන්නේ බාලයන් ආශ්‍රය නොකිරීම සුවයට හේතුවන බවයි. "අසේවනාච බාලානං" යනුවෙන් මෙය විස්තර කෙරේ. මෙහි "බාල" වචනයෙන් අදහස් කරන්නේ වයසින් බාල කුඩා දරුවන් හෝ ළමයින් නොව ගුණයෙන් හා නුවණින් මඳ පාපී ලෙස හැසිරෙන පුද්ගලයෝමය. නිදසුන් ලෙස පහත සඳහන් කරුණු සඳහන් කරන්නේ කාරුණික වූ සිතින්මය. යම් අයෙක් එම දුර්ගුණයන් ගෙන් යුක්තනම් අමනාප නොවී රහසේම එම දුර්ගුණ වලින් ඉවත්ව යහපත් වූ චරිතයකින් යුතු වීමට අදිටන් කරගත යුතුය."කතාවට, ආශ්‍රයට නෙවෙයි, ඔය මනුස්සයා ළඟටවත් යන්න එපා. මහා නපුරු පච්කාර කෙනෙක්" මේ වගේ කතාවක් ඔබ ගැන කියනවා අසන්නට කවදාවත් ඔබ කැමතිවන්නේ නැත. එසේ නම් පස්පව් දස අකුසල් වලින් මිදුනු අයෙක් බවට පත්විය යුතුය.

බාල හා ඇසුරට නුසුදුසු බවට පත්වන කරුණු කීපයක් පමණක් මෙහි සඳහන් කරමු. ප්‍රාණඝාත හෙවත් මිනිසුන් ඇතුළු සතුන් මැරීම, සොරකම් කිරීම, වංචා හා කපටිකම් කිරීම, ඉන්ද්‍රියන්හි අසංවර බව හා අශිලාචාර චරිතයකින් හෙබි කෙනෙක් වීම, බොරු කීම, ඵරුෂ වචන කීම, කේළම් කියා මිනිසුන් භේද කිරීම, සතුටින් හා සමගියෙන් වෙසෙන පවුල් අසමගියට පත්කිරීම, බොරු පොරොන්දු දීම, පොරොන්දු කඩ කිරීම, අනුන්ට නිකරුණේ අවමන් කිරීම, නින්දා කිරීම, මත්වතුර හා මත්ද්‍රව්‍යයන්ට ඇබ්බැහිවීම ආදි කරුණු මූලික වශයෙන් මෙහි සඳහන් කළ හැකිය.

ඉහත සඳහන් කළ ලක්ෂණයන්ගෙන් යුතු පුද්ගලයෙකුගේ චරිත ස්වභාවය බුදුරජාණන් වහන්සේ අංගුත්තර නිකායෙහි තික නිපාතයෙහි මෙසේ වදාළහ. "මේ ලෝකයෙහි බාල තෙමේ නපුරු සිතිවිල්ලක්ම සිතන්නේ ය. නපුරු වචනයක්ම කියන්නේ ය. නපුරු දෙයක්ම කරන්නේය" මෙවැනි දුර්ගුණවලින් හෙබි පාපී පුද්ගලයෙකු සමග දැන හෝ නොදැන ඇසුරට වැටුනොත්, යම් විටෙක කවර තරාතිරමක අයෙක් වුවද නුවණින් විමසා බලා කටයුතු නොකරන්නේ නම් පිරිහීමට ද විනාශයට ද පත්වන්නේ ය. මෙම පිරිහීමේ හා විනාශයේ තරම කෙතරම් ද යත් කාරුණික හදවතක් ඇති අය මහා අකාරුණික වූ වධකයෙකු විය හැකිය. පරිත්‍යාගශීලී අය මසුරු හා තද ලෝභීන් බවට පත්විය හැකිය. සංවරශීලී හා නීතිගරුක අය අදාන්ත හා නොහැදුනු, සමාජයට විපත්දායක අය බවට පත්විය හැකිය. සිල්වත් අය දුස්සීල විය හැකිය. බලවතුන් දුබලයන් බවට පත්වීම වැළැක්විය නොහැකිය. යහපත් කුමරෙක් වූ අජාසත්, දෙව්දත් තෙරගේ නරක ආශ්‍රය නිසා පිතෘ ඝාතකයෙක් වී අවීචි මහ නරකයෙහි උපදින්නට සිදුවීම කදිම නිදසුනකි. ජාතක පොතෙහි සඳහන් සත්තිගුම්බ ජාතකය ද මෙහිලා මෙනෙහි කිරීම වැදගත් ය. ගස්බෙනයක සිටි ගිරා පැටවුන් දෙදෙනා සුළඟකට ගසාගෙන ගොස් දෙපැත්තකට වැටුණි. එක් ගිරවෙක් සොරුන් පිරිසකගේ ආශ්‍රයටත් අනෙක් ගිරවා තාපසයන්ගේ ආශ්‍රයටත් පුරුදු වූහ. සොරුන්ගේ ආශ්‍රය ලැබූ ගිරවා ඵරුෂ වචන කතා කරන්නටත් තාපසයන්ගේ ආශ්‍රය ලැබූ ගිරවා මිහිරි හා ඉතාම ප්‍රිය වචන කතා කරන්නටත් පුරුදු වූහ. එකම අම්මාගේ කුසින් සහ එකම පියාණන්ට දාව උපන් සොහොයුරු සොහොයුරියන් අතර පවා ආශ්‍රය හේතුකොටගෙන විවිධ වෙනස්කම් ඇතිවන බව ඔබ බොහෝ ලෙස දැක ඇත. එමෙන්ම අසා ඇත.

පමුව තමා යහපත් කෙනෙක් බවට පත්වී ආශ්‍රයට සුදුසු අය සමග එකතු විය යුතුය. ඉහත සඳහන් කළ අයුරින් තමාගේ චරිතයෙහි "බාල" ගති හැකිතාක් දුරට අඩුකර ගත යුතුය. සම්පූර්ණයෙන් නැතිකරගැනීමට උත්සාහ ගත යුතුය.

"බාල" ගති ලක්ෂණ අඩු හෝ නැති අයෙක් නම් කවර හේතුවක් නිසා වුවද ඒවා නැති නොකොට ගෙන වඩාත් යහපත් කෙනෙක් ලෙස අනෙක් අයගේ ඇසුරට සුදුස්සෙක් විය යුතුය. මීළඟට, කෙනෙක් හෝ පිරිසක් සමග ඇසුරට පත්විය යුත්තේ ඔහු, ඇය හෝ ඔවුන් බලවත්; උගත්, ධනවත්, කුලවත්, ප්‍රසිද්ධ වීම නිසාම නොවේ. යම්විටෙක බොහෝ උගත්කම් ඇත්තේද පහත් හා නපුරු ගති පැවතුම් ද තිබිය හැකිය. රටේ ලෝකයේ ප්‍රසිද්ධ වුවද අයහපත් වූ චරිතයක් ඇති අයෙක් විය හැකිය. එමෙන්ම රට පිළිගත් උගත්කම් නැති වුවද මනා නුවණැති ආශ්‍රයට සුදුසු අය සමාජයේ බොහොම සිටිති. දුප්පත් වුවද බලවත් නොවුවද, ප්‍රසිද්ධ නොවුවද ආශ්‍රයට සුදුසු අය සමාජයේ සිටිති.

**"පූතිමච්ඡං කුසග්ගේන යෝ නරෝ උපනය්හති**
**කුසාපි පූති වායන්ති එවං බාලූපසේවනා."**

"යමෙක් කුසතණවලින් කුණු මස් ඔතයි ද, ඒ හේතුකොටගෙන කුසතණ ද දුගඳ හමන්නේය. එසේම බාලයා ආශ්‍රය කිරීමෙන් අපකීර්ති දුර්ගන්ධයම හමන්නේය" එබැවින් නුසුදුසු අය සමඟ ඇසුරට නොයා යුතුය. මේ නිසා ආශ්‍රයට නුසුදුසු වන්නේ කවර ගති ලක්‍ෂණ ඇති අය දැයි සිඟාලෝවාද සූත්‍රයට අනුව විමසා බලමු.

**පළමු තැනැත්තා අඤ්ඤදත්ථුහර නම් වෙයි.** එනම් මිතුරාට කිසිවක් නොදී නිතරම මිතුරාගෙන් ලබාගන්නට උත්සාහ කරන තැනැත්තායි. ඔහුගේ හෝ ඇයගේ ස්වභාවය මෙසේය. කිසිවක් රැගෙන නොපැමිණ මිතුරාගෙන් යමක් රැගෙන යයි. තමාට බියක් හෝ අවශ්‍ය තාවයක් ඇතිවිට පමණක් මිතුරා වෙතට පැමිණෙයි. ස්වල්පයක් දී බොහෝ දෑ බලාපොරොත්තු වෙයි. තමාගේ ලාභය සඳහාම ආශ්‍රය කරයි.

**දෙවැනි තැනැත්තා වචීපරම නම් වෙයි.** එනම් වචනයෙන් පමණක්ම සංග්‍රහ කරන තැනැත්තාය. උපකාරයක් ඉල්ලූ විට ඊයේ හෝ දින කීපයකට පෙර කීවා නම් කරන්නට තිබුණා යැයි පවසමින් අතීතයෙන් සංග්‍රහ කරයි. ඉදිරියේදී හෝ අනාගතයේදී උපකාර කරන්නෙමි යි අනාගතය දක්වා වචනයෙන් පමණක් සංග්‍රහ කරයි. මිතුරාට ප්‍රයෝජනයක් ලැබීමට නොහැකි නිරර්ථක හෝ රැවටිලි කතාවලින් සංග්‍රහ කරයි. උපකාරයක් ඉල්ලූ විට නැතිබැරිකම් කියා මඟහැරීමයි.

**තුන්වන තැනැත්තා අනුප්පිය භාණී නම් වෙයි.** එනම් තමාගේ ලාභය හා යහපත පිණිස මිතුරාගේ හොඳ හෝ නරක සියළු දේ අනුමත කරන මිත්‍ර වේශයෙන් පෙනී සිටින තැනැත්තායි. මිත්‍රයා පාපයක් කිරීමට සූදානම් වන විට එය ද අනුමත කරයි. යහපතක් කරන විට එය ද අනුමත කරයි. මිතුරා ඉදිරියෙහි නැති ගුණ ද කියමින් වර්ණනා කරයි. මිතුරා නැති තැන අගුණ කියයි.

**සිව්වෙනි තැනැත්තා අපාය සහාය නම් වෙයි.** සුරාවට කැඳවාගෙන යයි. අවේලාවෙහි තැන් තැන් වලට කැඳවාගෙන යයි. නිතර ධනය වියදම් කරවන විනෝදනවීම් වලටම කැඳවාගෙන යාමට බලයි. සූදුවට පුරුදු කරයි.

බාල හෙවත් නරක පුද්ගලයාගේ ගති ලක්‍ෂණ මෙසේ නුවණින් දැන පළමුව තමා යහපත් කෙනෙක් වීමට වීර්ය කිරීම අගනේය. මින් අනතුරුව යහපත් ගුණ ඇති පිරිසක් සමග ආශ්‍රය කළ යුතුය. සමාජයේ කටයුතු කිරීමේදී හොඳ හා නරක සියලු දෙනා සමග කටයුතු කරන්නට සිදු වේ. එවැනි අවස්ථාවලදී කෙනෙකුගේ යහ ගුණවලට බැඳී කෙනෙකුගේ දුර්ගුණවලට හසුනොවීමට තරම් කල්පනාකාරීව කටයුතු කිරීම වටී. වර්තමාන සමාජ පරිසරය බොහෝ අවස්ථාවල කාමයට, මුදලට, පෙනුමට හා ප්‍රසිද්ධිය දෙසටම ගමන් කරන බව පෙනේ. ඔබ යහපත් කෙනෙක් වී සමාජයේ, කාර්යාලයේ, ආයතනයේ පමණක් නොව මඟතොට බස්රිය හා දුම්රියේ දී පවා පරිස්සම් විය යුතු බව සිහිපත් කරන්න. වංචාකාරී හා මායාකාරී නපුරු අයට රැවටී වටිනා තරුණ ජීවිත විනාශ කරගත් තරුණ දියණිවරුන් හා පුතණුවරුන් බහුලව දක්නට ලැබේ.

මේ නිසා දෙමාපියන් විසින් "පාපා නිවාරෙන්ති" ලෙසින් දක්වා ඇති පරිදි තම දරුවන් කුඩා කල පටන් අයහපත් ආශ්‍රයෙන් ද පවින් ද වැළක්වීමට උත්සාහ ගැනීම උතුම්ම වගකීමක් හා යුතුකමක් ද වෙයි. ආවාහ විවාහයන්ට පත්වීමට බලාපොරොත්තු වන දූ පුතුන් විසින් ද තම සහකරුවන් හා සහකාරියන් පිළිබඳව යහපත් වූ අවබෝධයක් තිබිය යුතුය. දුටු පමණින් හෝ කතා කළ පමණින් නොව පරීක්ෂාකාරී ආශ්‍රයෙන්ම මේ බව දත යුතුය. විවාහයකදී දෙමාපියන්ගේ අනු දැනුම හා ආශිර්වාදය අවශ්‍ය කරන්නේ මේ නිසාය. "භරියාව පරමා සඛා" යයි ධර්මයෙහි සඳහන් කරන පරිදි විවාහයෙන් පසු ස්වාමිපුරුෂයාට හොඳම යෙහෙළිය වන්නේ බිරිඳයි, බිරිඳට හොඳම යහළුවා විය යුත්තේ ස්වාමි පුරුෂයාය. දෙමව්පියන් සහ දරුවන් අතර ද උතුම් වූ ආශ්‍රයක් පැවතිය යුතුය.

**"චරං චේ නාධිගච්ඡෙය්‍ය සෙය්‍යං සදිසමත්තනෝ**
**ඒක චරියං දළ්හං කයිරා නත්ථි බාලේ සහායතා"**

" ගුණයෙන් උසස් අයෙක් ආශ්‍රය කරන්න. නැතිනම් තමාට ගැළපෙන
ගුණ ඇති අයෙක් ආශ්‍රය කරන්න. එවැනි කෙනෙක් හෝ ආශ්‍රයට
නොලැබුණොත් හුදකලාව වාසය කිරීම යහපත් ය. බාලයන්ගේ ආශ්‍රය
පිරිහීමට හා විනාශයටම හේතුවන බැවිනි"

එක් කලෙක බෝසතාණන් වහන්සේ පැවිදිව වනයෙහි වැඩ වසන විට තමන් වෙතින් මිනිසුන් අතරට යාමට සූදානම් වූ තම පුතණුවන්ට දුන් උපදේශාත්මක ගාථා රත්නයෝ දෙපළක් ආරණ්‍ය ජාතකය ඇසුරින් ඔබට ද කාරුණික සිතින් යුතුව පෙන්වා දෙමි.

**" යස්ස කායේන වාචාය මනසා නත්ථි දුක්ඛමං**
**උරසීව පතිට්ඨාය තං භජේහි ඉතෝ ගතෝ"**

"දරුවා නුඹ වනයෙන් ගිය කල්හි යමෙක් සිත කය වචනය නම් වූ තිදොරින්
පව් නොකෙරේ ද, ඔහු හෝ ඇය ඔබගේ මව ලෙස සළකා ඇසුරු කරන්න.

**"හලිද්දිරාගං කපිචිත්තං පුරිසං රාග විරාගිනං**
**තාදිසං තාත මා සේවි නිම්මනුස්සම්පි චෙ සියා"**

"දරුවා තිර නොවූ බැවින් වහා සේදී යන්නාවූ කහ සායම් වැනි වූ චපල සිත්
ඇත්තාවූ ඉක්මනින් වෙනස් වන සුළු පුද්ගලයා,
මේ භූමියේ මිනිසුන් නොමැති වුවද ඇසුරු නොකරන්න"

පාප මිත්‍ර ආශ්‍රයෙන් වැළැකී කල්‍යාණ මිත්‍ර සම්පත්තියෙන් යුතුව උතුම්
චතුරාර්ය්‍ය සත්‍ය ධර්මයම අවබෝධ වේවා"

බත්තරමුල්ල පන්නිපිටිය පාරේ සිරි සුදස්සනාරාම සදහම් සෙනසුනෙහි ප්‍රධාන අනුශාසක
ආචාර්ය පූජනීය මිරිස්සේ ධම්මික ස්වාමීන් වහන්සේ විසිනි.

**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සේවයේ යෙදී සිට මියගිය සියළු දෙනාම**
**සුගතියෙන් සුගතියට පත්වීමට මේ පින හේතුවේවා ! එහෙර රැකියාවෙහි නිරතවන**
**සියළුම සංක්‍රමණික සේවකයින්ට ද දැනට සේවයේ යෙදී සිටින සභාපතිතුමා ඇතුළු**
**සියළු කාර්ය මණ්ඩලයටද නිරෝගී සුව දීර්ඝායුෂ පැතීම සඳහා බෞද්ධ සංගමය දහම් පඬුරකි**

**ඔබේ මියගිය ඥාතීන් සිහිපත් කර මෙම සදහම් පත්‍රිකාව මුද්‍රණය කිරීමට ඔබට දායක විය හැක. දුරකථන : 011 2864134**